# අස්ගිරි මහාවිහාරයීය භාවනා සම්ප්‍රදාය

වයි. කේ. තිස්ස බණ්ඩාර

අස්ගිරි මහාවිහාරයට අයත් විහාරස්ථාන කීපයක තිබූ පුස්කොළ පොත් ග්‍රන්ථ රත්න සතරක් විවිධ උගතුන්ගේ අති මහත් පරිශ්‍රමයෙන් සංස්කරණය කරන ලදුව ප්‍රකාශයට පත්ව තිබෙයි. අස්ගිරි මහාවිහාරයීය භවනා සම්ප්‍රදාය පිළිබඳව කරුණු හැදෑරීම සඳහා එම කෘති තුළින් ලැබෙන පිටුවහල අති මහත් ය. ඒවා විමුක්ති මග්ගො[1] , මන්දරම්පුර පුවත[2], අස්ගිරි තල්පත[3], අස්ගිරි උත්පත්තිකථා ප්‍රකරණය[4], යන කෘති වෙත්. මෙම කෘති සතර තුළින් ප්‍රථම කෘතිය පිළිබඳ ව  බලංගොඩ අති පූජ්‍ය ආනන්ද මෛත්‍රිය නායක හිමිපාණෝ මෙසේ සඳහන් කරති.

"කලකට පෙර නංජියෝ නම් පඬිවරයා විසින් සැකසුණු චීන බෞද්ධ ග්‍රන්ථ නාමාවලියක් පළ විය. එහි උපතිස්ස නම් රහතකු විසින් රචිත විමෝක්ෂමාර්ගශාස්ත්‍ර නම් පොතක තතු සඳහන් විණ. එය ක්‍රි.ව. 505 පමණ දි සංඝභද්‍ර නම් තෙරකෙනකුන් විසින් ලක්දිවින් චීන භාෂාවට නගා ගෙනයන ලද්දකි. මෙ පොත පිළිබඳ වඩාත් සවිස්තර නිබන්ධනයක් ජපන් රටැ ටෝකියෝ නුවර ඉම්පීරියල් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඇම්. නගයි මහතා විසින් එංගලන්තයේ පාළි පොත් සමාගමේ සඟරායෙහි මෙයින් සුසාලිස් වසකට උඩදී පළකැරවිණ. එහි යටකී පොතේ නම විමුක්තිමග්ගයැයි සඳහන්

විය. පාලිවිසුද්ධිමග්ගයත් විමුක්තිමග්ග චීන පරිවර්තනයත් දෙකෙහි සැසඳීමෙක් එහි ඇතුළත් විය. විසුද්ධිමග්ග ගුරුපොත විමුක්තිමග්ග වී යැ යනු නගයි මහතාගේ මතය ය. මෙයින් ටික කලකට පසු ආචාර්ය බපත් මහතා විසින් විසුද්ධිමග්ග විමුක්තිමග්ග දෙකේ සම විසම තැන් පිළිබඳ දීඝී වාර්තාවෙක් පළ කැරැවිණි.

විසුද්ධිමග්ගටීකායෙහි ද විසුදධිමග්ගයට පැරකුම්බා රජු ලියූ සන්නසෙහි ද මේ විමුක්තිමග්ගය ගැන සඳහන් වේ. එබැවින් බුදුගොස් තෙරුන්ටත් පෙරැම ලක්දිව නිපැයුණු මේ පැරණි ධර්මසංග්‍රහය පිළිබඳව තතු සෙවීමෙහි බොහෝ දෙනෙක් උනන්දු වූහ. ලක්දිව තුබූනු මුල් පොත අභාවයට ගියේ වනැයි ඒ කාගෙත් පිළිගැන්ම විය. මේ අතර වර්ෂ කීපයකට පෙර කොළඹ බම්බලපිටියේ වජිරාරාම වාසී සෝම ඛෙමින්ද යන දෙනම (පැවිදිවන්නට පෙර) ජපන් රට ගොස් 1936 වස තුළ දී ගෙ දත්සුදෝ රොං (විමුක්තිමග්ග) නම් පොත ජපන් ඇදුරක්හු ගේ සහායත්වය ද ලැබ ඉංගිලිසියට නැගූහ. මෙය නොබෝ ද (1961 වැන්නෙහි) ලක්දිව මුද්‍රිත විය.

මෙය මුලදී හෙළ අටුවා සෙයින් හෙළ බසින් ම රැසැසුණෙකැයි අප අදහස විය. මේ බව බලපිටියේ පණ්ඩිත විශුද්ධාලෝක මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් සිංහලයට නගා පළ කැරැවුණු විසුද්ධිමග්ගයේ තෙවැනි කාණ්ඩයේ මුලට යොදන ලද ප්‍රස්තාවනාවෙහි දක්වා ඇත. එහෙත් ඒ අදහස මදක් වෙනස් කරන්නට අපට සිදුවිය. එයට කරුණු වූයේ පාලි විමුක්තිමග්ගය දක්නට ලැබීමයි. මේ දුර්ලභ ග්‍රන්ථය ලක්දිව ම කොහේ හෝ ඇතැයි සැලකූ අස්ගිරි වෙහෙර වැසි ගල්කැටියාගම සිරි රතනජෝති, කරල්ලියැද්දේ සිරි රතනපාල යන දෙ මහ තෙරණුවෝ මහදුත්සාහයෙන් මෙය සොයා ගත්හ. සියවස් ගණනාවක් ම ගුප්තව රැඳුණු මේ පැරණි මහඟු පොත දැන් එළි දකී. මෙය සම්බන්ධ සියලු තොරතුරු උන්වහන්සේගේ පූර්විකායෙහි දැක්වෙයි."[5]

විමුක්තිමග්ග සහ විසුද්ධිමග්ග පිළිබඳ විවිධ කරුණු සම සමව පැනෙයි. බලංගොඩ අති පූජ්‍ය ආනන්ද මෛත්‍රී නාහිමිගේ



අදහස වන්නේ "විසුදධිමග්ගය හා සසඳා බැලීමේ දී විමුක්තිමග්ගය ගුරුපොත කොට ගෙන විසුද්ධිමග්ගය රැසැයුණැ යි කිව නොහැක්ක" යනුයි.[6] "උපතිස්සගේ ඇටසැකිල්ලක් හෝ රාමුවක් වැනි විමුක්තිමග්ගය තමන් ඉදිරියේ ඇතිව බුද්ධඝෝෂ විසින් විසුද්ධිමග්ගය ලියූ බවද, තම හසල බුද්ධියෙන් හා පාණ්ඩිත්‍යයෙන් එහි අඩු තැන් පුරවා ශ්‍රේෂ්ඨ කෘතියක් නිපද වූ බව අප නිගමනයයි"

මේ වනාහි පූනානුවර පර්ගියුසන් විද්‍යාලයේ පාලි භාෂාව පිළිබඳ ආචාර්යවරයෙකු වූ ඇම්. ඒ, පී.එච්. ඩී. උපාධිධාරී පී.වී. බාපත් මහතාගේ මතය විශුද්ධිමාර්ග මහාසන්න ප්‍රස්තාවනාවෙහි දැක් වූ සැටිය. මෙයින් විශුද්ධිමාර්ගය විමුක්තිමාර්ගය ළඟ තබාගෙන එහි ඌනපූරණය කරමින් නිපදවන ලද ග්‍රන්ථයක් බව හෙළි වෙයි.[7]

විමුක්තිමග්ගය පිළිබදව විශාරද පඬිවරු කීප දෙනෙක් ම විවිධ අදහස් පළ කළහ. ඒවා විවිධ ග්‍රන්ථයන්හි අන්තර්ගතව තිබෙයි. මේ අදහස් බොහෝ ඒවා ගෙනහැර දක්වමින් ඉඳුරුවේ අති පූජ්‍ය උත්තරානන්ද මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ මෙසේ දක්වති. "අප අතර අභාවයට ගිය විමුක්තිමාර්ගය පිළිබඳව අගනා විවරණයක් අපට ලැබුණු බව නොමසුරුව කියමු. එහෙත් විශුද්ධිමාර්ගය පිළිබඳව කළ විවේචනය අප සිත් නොගත් බවද කිවයුතුවැ තිබේ. විශුද්ධිමාර්ගය විමුක්තිමාර්ගයේ ඌන පූරණයක්වත් පරිවර්තනයක්වත් නොවන බව අපගේ හැඟීමයි."[8]

විමුක්තිමග්ග පිළිබඳව ආචාර්ය පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමියෝ ද සිය අදහස් ප්‍රකාශ කරති. ඉන් තරමක් මෙසේ ය. "විමුක්තිමග්ගය සංස්කරණය කළ උක්ත හිමිවරු දෙදෙනා ඊට කාණ්ඩ තුනක් ඇතුලත් කර තිබේ. පළමු කාණ්ඩය 'විමුක්තිග්ගො' නමින් ද දෙවැන්න 'විමුක්තිමග්ගො - උද්දනං' නමින් ද තෙවැන්න 'මහනුවර අස්ගිරි අරණ්‍යාවංශාගත විදර්ශනා පොත'නමින් ද නම්කර තිබේ. බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය හිමියන් ස්වකීය පෙරවදන අවසානයේ දී දක්වා ඇත්තේ මෙම තෙරවරුන් දෙදෙනා ස්වකීය ග්‍රන්ථයේ දෙවැනි කොටස සේ දක්වා ඇති "විමුක්තිමග්ගො - උද්දනං" යනුවෙන් වූ ගාථා රාශිය පාලි

විමුක්තිමග්ගයට අයත් නොවන බව තමන්ට හැගෙන බවයි. 1972 දි මෙම සිංහල සංස්කරණය විමර්ශනයට ලක්කළ පී.වී. බාපත්ගේ අදහස ද එයයි. මෙහි ලා මා දරන අදහස ද එය මැයි. වෙසෙසින් ම එම උද්දන ගාථාවන් විමුක්තිමග්ගයේ අන්තර්ගතය සමග ගැළපීමට මා උත්සහ කළත් එය කරගත නොහැකි විය.

එම නිසා දැනට මුද්‍රිත විමුක්තිමග්ගය වෙන ම කෘතියක් බවත් විමුක්තිමග්ග සංශෝධකයන් දක්වන උද්දන ගාථා සමග එහි කිසිදු සම්බන්ධයක් නැති බවත් මෙහි ලා අපි වටහා ගත යුත්තෙමු. මෙයින් පැහැදිලි වන්නේ මෙම උද්දන ගාථා යනු ස්වාධීන ගාථා සංග්‍රහයක් බවයි.

ග්‍රන්ථ සංශෝධක දෙනම තුන්වැනි කාණ්ඩය සේ දක්වා ඇත්තේ දෙවැනි කාණ්ඩයවන විමුක්තිමග්ග - උද්දනගාථාවන්ගේ විස්තර සහිත පාලි මිශ්‍රිත සිංහල කෘතිය බව හඳුනාගන්නට මා හට හැකි විය. එබඳු හඳුනාගැනීමක් ආනන්ද මෛත්‍රිය හිමියන් විසින් හෝ සංශෝධක තෙරවරුන් විසින් හෝ බාපත් විසින් හෝ සිදුකර නොමැති බව ද සඳහන් කරනු වටියි. ග්‍රන්ථ සංස්කරණයේ දී මෙම තෙරවරුන් සොයාගත් සියලු පිටපත් එකී තෙවන කාණ්ඩයට අයත් ඒවා බවත් උන්වහන්සේලා විසින්ම සඳහන් කර තිබීමෙන් පැහැදිලි වන්නේ උක්ත උද්දන ගාථා සංග්‍රහය ගුරු කොට පාලි සිංහල මිශ්‍රකෘති ගණනාවක් බිහි වී ඇති බවයි. එම කෘති හැඳින්වී ඇත්තේ මුන්වහන්සේලා සිය සංස්කරණයේ තුන්වැනි කාණ්ඩය හැඳින් වූ "මහනුවර අස්ගිරි අරණ්‍යාවංශාගත විදර්ශනා පොත" යන නමින් ම නොවන බවත් අමතාකර වණ්ණනා, කම්මට්ඨානදීපනී, විමුත්තිදීපනී, විමුක්තිමග්ග දීපනං, කමටහන් පොත, විදර්ශනා පොත, යනාදි නම්වලින් බවත් උක්ත විඥාපනයේ ම දැක්වේ. එම සියලු කෘතිවල මූලාශ්‍රය උක්ත උද්දාන ගාථා සංග්‍රහය විය යුතු. එයින් පැහැදිලි වන්නේ මෙම උද්දාන ගාථා යනු අස්ගිරි විදර්ශනාව පිළිබඳ මූල ග්‍රන්ථය  බවයි.

එම නිසා අස්ගිරි විහාරයේ විදර්ශනා කමටහන් පොත යනු විමුක්තිමග්ගය නොව මෙම උද්දන ගාථා සංග්‍රහය බව මාගේ නිගමනයයි."[9]



විමුක්තිමග්ග හෝ ඉහත දක්වන ලද සෙසු ශීර්ෂවලට අයත් අස්ගිරියේ පුස්කොළ පිටපත දැන් අභාවයට ගොස් ඇති නිසා ඒ ගැන විශ්ලේෂණ කිරීමක් සඳහා ඉඩක් නැත. එකී දුර්ලභ පුස්කොළ පිටපත භාවිත කරමින් 'විමුක්තිමග්ගො' නමින් ග්‍රන්ථයක් එළි දක්වන ලද සංස්කාරක හිමිවරු එම පොත පිළිබඳව දක්වන ලද අදහස්වලින් තරමක් මෙසේ ය. "මෙය දෙවියන් පත්ඉරු තුන්සීයක පමණ හපෙළ අටපෙළ ලියා සිතියම් කළ පොත් කම්බ දෙකක් යොදා අතින් ගෙතූ පොත් හුයකින් වෙලා ලෙංසුවක් ඔතා  පොත් පුසුම්බියක (පොත් ළරයක) ලා නැවතත් හුයකින් වෙලා ඒ මත "මහා විහාර  අස්ගිරි වංශයෙ කමටහන් පොත" කියා උච්චිට්ටුවක් පිටින් අලවා තිබුනේය."[10]මෙහි දක්වන ලද උච්චිට්ටුව යනු පුස්කොළ පොත්වල නාමය සඳහන් ලේබලයයි. මෙය තල්පත්/තලපත් දෙකේ සහ කඩදසියෙහි ද ලියනු ලැබේ. එහි අලවා තිබූයේ කුමන මාධ්‍යක ලේබලයක් දැයි සඳහන් නොවේ. කාලය පිළිබඳ හැඳින්වීමක් නැති මේ පොත ස්වාභාවයෙන් ම තරමක් පැරණි බව උක්ත පෙරවදනේ ඇති තොරතුරු අනුව සිතා ගත හැකිය.

විමුක්තිමග්ග සංස්කාරක හිමිවරු සහ වෙනත් පඬිවරු විසින් දක්වනු ලැබ ඇති පරිදි මෙය කොටස් තුනකින් යුත් එකතුවකි. මෙම කොටස් ත්‍රයෙහි ම අන්තර්ගතය වන්නේ යෝගාවචර භික්ෂුන්වහන්සේගේ භාවනාව සඳහා වූ කමටහන් සහ තවත් ධර්ම කරුණු ය.

මෙහි ප්‍රස්තුත මාතෘකාව අනුව අස්ගිරි මහාවිහාරයට සුවිශේෂී වූ භාවනා සම්ප්‍රදායක් තිබුණි ද යන්න ප්‍රශ්නයකි. බුදුන්වහන්සේගේ ඉගැන්වීමට අනුව භාවනා ක්‍රම කීපයක්ම ඇත්තේ ය. එමෙන් ම පුරාණයේ පටන් ම විවිධ භාවනා ක්‍රම සහ සම්ප්‍රදයන් පැවති බවට ඉතිහාසය සාධක එලවයි. අනුරාධපුර රාජධානි සමයේ පාංශුකූලික භික්ෂුන්වහන්සේ  වෙනුවෙන් පධානඝර යන නාමයෙන් භාවනාව සඳහා වෙන් වූ ආරාම විශේෂයක් තිබිණ. ග්‍රාමවාසී සහ අරණ්‍යවාසී ලෙසින් භික්ෂුන්වහන්සේ දෙපිරිසක් එසමයෙහි වැඩ සිටිය හ. ඉතා පසු කාලයේත් වර්තමානයේත් ඒ එසේ මැයි. විමුක්තිමග්ග පොතට අනුවත් අස්ගිරි මහාවිහාරයේ කමටහන් පොතට අනුවත්

බඹරගලේ පොත නමින් යුත් කොටසටත් අනුව අස්ගිරි මහාවිහාරය හා සම්බන්ධව ආරණ්‍යක සම්ප්‍රදයේ භාවනා ක්‍රමයක් ඇති බවත් තහවුරු වන්නේ ය. (බඹරගලේ පිටපත දැනට වසරක් පැරණි පිටපතක් බවට සාධක තිබෙයි).

අස්ගිරි මහාවිහාරයීය සංඝ පරම්පරාව අදළ ඓතිහාසික පුවත අනුව බුදු සසුනේ අවිච්ඡින්නව පැවත එන සඟ පරපුරක් බව ප්‍රකට වෙයි. අනුරපුර මහාවිහාරයෙන් දිඹුලාගලටත් දිඹුලාගලින් යාපහුව අසළ වලස්ගලටත් එයින් සෙංකඩගලටත් විකාශනය වූ මෙම සංඝ පරම්පරාව අස්ගිරියෙන් තවත් ස්ථාන රැසක් වෙත ව්‍යාප්ත වූ බවට සාධක පවතී. එවකට අස්ගිරි මහාවිහාරයේම ප්‍රාදේශීය විහාරයක් වූ ඓතිහාසික බඹරගල විහාරය ඉතා පෙර සිටම පැවත එන ආරණ්‍ය සෙනසුනකි. ඒ බවට එහි ඇති ලෙන්වල තිබෙන පූර්ව බ්‍රාහ්මී ලිපි සාක්ෂි සපයයි. "ඒවා කටාරම කෙටූ ගල්ලෙන් ආශ්‍රිතව පිහිටයි. ඉන් එක් ලෙනක් පොචනිරාජ නාගයාගේ භාර්යා, බ්‍රාහ්මණ කොජරගේ දුව වූ උපාසිකා දත්තාගේ ය." තවත් ලිපියක් උත්තරදත්ත තෙරුන්ගේ ය. එහි නාමය මනාපදස්සන නම් වෙයි. එහිම ඇති තවත් ලිපියක් ප්‍රමුඛ අනුරාධ නම් අය විසින් පූජා ලද්දකි. බ්‍රාහ්මී අක්ෂර දකුණ සිට වමට කියවිය යුතු අනෙක් කෙටි ලිපිය "ඉදශල ගුහා ශගශ" යනුවෙන් දක්වා ඇත්තේ ඉන්දසාල ගුහාව සංඝයාට යන අර්ථයෙන් ය. ඉතා පුරාණ සමයක සිට පැවත ආ මෙම ආරණ්‍ය සේනාසනය මහනුවර රාජ සමයේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදුව ප්‍රතිමා මන්දිර ආදියෙන් සමලංකෘත කළ බව බඹරගල තඹ සන්නසෙහි දක්වයි. මෙහි වූ ගල් ලෙන් පිළිබඳව රජුට විස්තර සපයා ඇත්තේ විදර්ශනාධූරයෙහි අනුනායක වූ රඹුක්වැල්ලේ රතනජෝති ස්වාමින්වහන්සේ විසින් බව ද එහි ම දක්වයි.[12]

"මේ කරුණෙහි දී බඹරගල විහාරය ඉතා වැදගත් කොට සැලකිය හැකිය. වර්තමාන කන්ද උඩරට පහත දුම්බර වැවේමෙ වසමට අයත් ප්‍රදේශයෙහි බඹරගල රජමහ විහාරය පිහිටා ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මෙම බඹරගල විහාරයේ සියලු විහාර කර්මාන්ත කොටඅස්ගිරි මහාවිහාරයීය විදර්ශනාධූරීන



භික්ෂූන් වහන්සේට තඹ සන්නසකින් පවරා දෙන ලදී."[13] ආචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නා හිමියෝ එසේ සඳහන් කළ ද බඹරගල තඹ සන්නසින් එම විහාරය එකී රජු විසින් අස්ගිරියේ භික්ෂූන්වහන්සේට පවරාදෙන ලද වගක් එම සන්නසෙහි සඳහන් නොවෙයි. එහි දැක්වෙන්නේ "රාජාධිරාජසිංහ රජු පැමිණි සයවෙනි වස මෙම රතනජෝති සාමින් විසින් පින් දක්වාපු තැනේදි ශ්‍රී චිත්තාර්වින්ද ප්‍රබෝධව උඩසියපත්තුවබද පොද්දල්ගොඩට අයිති දැවතැන්න කියන බිම්වාසියෙන් නැගෙනහිරින් ඇල්ලෙන් පහලත් දකුණු දිගින් ගල්හිරියෙන් අනුග්ගහ කඳුරෙන් මෙපිටත් බස්නාහිරින් ගල්වැටෙන් උඩත් උතුරු දිගින් කටුගොඩ ඇල්ලෙන් මෙපිටත් ගල්හිරියෙන් පහලත් මෙ කියාපු කඩයින්වලටමැදි වූ බින්වාසිය රතනජෝති ස්වාමින්ගේ සිශ්‍යානුසිශ්‍ය පරම්පරාව දක්වා බඹරගලේ විහාරෙට පුද ලක්කන් පවත්තන පිණිස කිසිකෙනෙකුන් විසින් අවුල් උද්ධරණයක් නොකර ශාසනාන්තර්ධානය දක්වා ස්ථිරව පවත්නා නියායෙන් තඹහා ලියා දෙන්නේය" යන්නයි.[14] "බඹරගල සන්නසින් පැහැදිලිවන පරිදි එවකට මෙහි වැඩ සිටියේ අස්ගිරි විහාරයේ විදර්ශනාධූරයේ අනුනායක රඹුක්වැල්ලේ රතනජෝති හිමිපාණන් ය."[15] මේ බව තහවුරු කෙරෙන තවත් ඓතිහාසික ලියවිල්ලක් තිබෙයි. ඉන් කොටසක් මෙසේය. "අස්ගිරි පේරුවේ බොහෝ භික්ෂු සාමණේරාදින් ග්‍රන්ථ ධූරයෙහි හික්මවමින් පර්යාප්ති ශාසනයද, එසේම විදර්ශනාධූරයෙහි අනුනායකත්වයට පැමිණි රඹුක්වැල්ලේ රතනජෝති නායක ස්වාමින්වහන්සේ ද ගුරුබැබිලේ අනොමදස්සි තෙරුන්වහන්සේ ද යන දෙනම ශ්‍රී වර්ධනාපුරාසන්න උඩවාසලවත්ත බද රාමවිහාරයෙහි ගුරුවර ලෙසින් සිටගත අස්ගිරි පේරුවේ බොහෝ භික්ෂු සාමණේරාදීන් සමසහලිස් කර්මස්ථානවල හික්මවමින් ප්‍රතිපත්තිශාසනය වර්ධනය කළාහ."[16]

අස්ගිරි මහා විහාරයෙහි ග්‍රන්ථ හා විදර්ශනා වශයෙන් ධූර දෙකක් පැවති බව ඓතිහාසික ලේඛන මූලාශ්‍ර සපයති. එයින් විදර්ශනා ධූරයෙහි අනුනායක තනතුර රඹුක්වැල්ලේ රතනජෝති නායක හිමිට ලැබී තිබූ අයුරුත් මෙම ධූර දෙකෙහිම නායකත්වය

එවකට උරුලෑවත්තේ ධම්මසිද්ධි මහානායක ස්වාමීන්වහන්සේට හිමිව තිබුණු බවත් අස්ගිරි උපත හෙළි කරයි. ඒ මෙසේ ය.

"අස්ගිරි මහාවිහාරපේරුවේ සාමණේර නවක මධ්‍යම ථෙර සංඛ්‍යා සැමතැන්වලට ඉශ්වර වු ශිලධුතව්‍රතාලේ පනච්ජාතාදි ලෞකික ගුණගණාභරන විභූෂිත ග්‍රන්ථවිදර්ශනාධූර දෙකෙහි මහනායකත්වයට පැමිණිඋරුලෑවත්තේ ප්‍රියදර්ශි ධම්මසිද්ධි මහනායක සාමින්වහන්සේට අතවැසි වැ පැවිදිවරුන්ගේ පරම්පරාව ......."[17]

මෙම විහාරයේ ග්‍රන්ථධූරයෙහි ආරම්භය ක්‍රිස්තු වර්ෂ 1364 සමයේ දී ද පැවැති බවට අස්ගිරි තල්පත සාක්ෂි දරයි. [18] එකල ග්‍රන්ථධූර වඩන තැන් සඳහා ධර්මචාරිව සිට ඇත්තේ රාජනාරායන වික්‍රමබාහු නම් තෙරුන්වහන්සේ කෙනෙකි. අස්ගිරි තල්පත පෙන්වා දෙන පරිදි එසමයෙහි රජු වන්නේ වික්‍රමබාහු රජු ය.[19]

අස්ගිරි විහාරයේ විදර්ශනා ධූරය පිළිබඳව තොරතුරු දක්වන අස්ගිරි තල්පතෙහි මෙසේ සඳහන් වෙයි. "රම්බලක අනෝමදස්සී මහතෙරුන් වහන්සේ උකුත්ව ගිය සඳ, ශාසනාරක්ෂාව සඳහා ධර්මධර විනයධර මහතෙරුන් වහන්සේල තෝරා උන්වහන්සේලාට ගණදෙවු ආයතන පදවි ප්‍රදනය කරන ප්‍රස්ථාවේ අස්ගිරි විහාර ගණයේ ග්‍රන්ථ විදර්ශන වඩන සැම තැන එක්සිත්ව කළ සම්මතය නිසා මහනෙත්ගම සිද්ධාර්ථ මහතෙරුන් වහන්සේට අස්ගිරි විහාර ගණයේ නායක ථානාන්තරය බුද්ධ වර්ෂයෙන් එක්ව දහස් නවසිය සූතිස්වන්නෙහි වීරබාහු මහාවාසලින් පළමුකොට ලැබුනාය."[20] මේ කියන වකවානුව වනුයේ ගම්පළ නුවර වීරබාහු රජකළ ව්‍යවහාර වර්ෂ 1391 (ක්‍රි.ව) සමයයි.

ඉහත කරුණු හා වෙනත් කරුණු අනුව අස්ගිරි මහාවිහාරයේ ග්‍රන්ථ ධූරය සහ විදර්ශනා ධූරය යන ධූර දෙකෙහිම ප්‍රාගුණ්‍යතාවයෙන් හෙබි යතිවරයන් වහන්සේ වැඩ සිටි බව ප්‍රකට වෙයි. අස්ගිරි මහාවිහාරයට ආවේනික වූ විදර්ශනා භාවනා ක්‍රමයක් පැවති බව විවිධ මූලාශ්‍ර කෙරෙන් පැහැදිලි වෙයි. මේ පිළිබඳව අත්පොත්



ද ලියැවී තිබිණ. දැනට මුද්‍රිතව පවතින 'විමුක්තිමග්ග' කෘතිය මෙයට ප්‍රධානතම මූලාශ්‍රය වන්නේය. මෙහි කොටස් තුනකි. එනම් විමුක්තිමග්ගො, විමුක්තිමග්ගො දද්දනං, අස්ගිරි මහා විහාරයීය කමටහන් පොත යනු එම කොටස් තුනයි. මෙම කොටස් ත්‍රය ම පිළිබඳ විවිධ අදහස් පවති. මෙම විහාරය හා තදනුබද්ධ ප්‍රාදේශීය පැරණි විහාර කීපයක ද මේ ආකාර කමටහන් පොත් තිබීම අනුව පෙනී යනුඹයේ ක්‍රමානුකූල ක්‍රමවේදයක් අනුව විදර්ශනා ධූරින භික්ෂුන්වහන්සේ කමටහන් වැඩූ බවයි. මෙයට අස්ගිරි මහාවිහාරයීය භාවනා සම්ප්‍රදය යයි කියමු. මේ පිළිබඳව ආචාර්ය පූජ්‍ය තුඹුල්ලේ සීලක්ඛන්ධ නාහිමියෝ මෙසේ ද සඳහන් කරති. "විදර්ශනා භාවනා ක්‍රමය අස්ගිරි මහාවිහාරයට අනුබද්ධ ආයතනවල පැවති ඉගැන්වීමක් බවට මේ පොත් සාක්ෂි දරයි. ඒ හැරුණු එයින් අස්ගිරි මහාවිහාරයේ තත් භික්ෂූන්වහන්සේලාගේ අධ්‍යාපනික චින්තනය යොමුකර තිබුණේ කුමක් අරමුණු කොට ද යන්න පිළිබඳ ඉඟියක් ද ප්‍රකට වෙයි."[21]

අස්ගිරි තල්පත සඳහන් කරන පරිදි දිඹුලාගලින් යාපහුවටත් ඉන් අනතුරුව වලස්ගලටත් එයින් පසුව සෙංකඩගලපුර නුවරටත් ව්‍යාප්ත වූ භික්ෂු පරපුර පැහැදිලි වශයෙන් ම ආරණ්‍යකවාසි විදර්ශනා ධූරිනභික්ෂූන්වහන්සේ වෙති. විවිධ කාලයන්හි දී දිවයිනේ දූරස්ථ ප්‍රදේශවලද අස්ගිරියට අයත් සේනාසන පැවති බවට සාධක තිබෙයි.[22] මේවායින් ස්ථාන කීපයක් මෙසේයි. කුකුලාගල, අත්තනගල්ල, මුල්කිරිගල, හන්තාන, කැලණිය, මණික්කඩවර, පලාබත්ගල ආදියයි. අස්ගිරි විදර්ශනා ධූරින භික්ෂූන්වහන්සේ සමසතලිස් කර්මස්ථානවල හික්මවමින් ප්‍රතිපත්ති ශාසනය වර්ධනය කළ බව අස්ගිරි උපත පැහැදිලි කරයි.[23]

සමසතලිස් කර්මස්ථාන යනු බෞද්ධ ශබ්ද කෝෂයට අනුව මෙසේ ය. "භාවනාවට උපයෝගී කර ගන්නා හතලිහක්වන අරමුණු : කර්මස්ථාන හතලිහ : ඒවා නම්, දස කසිණ, දශ අශුභ, දස අනුස්මෘති, සතර බ්‍රහ්මවිහාර, සතර ආරූප්‍ය, ආහාර පටික්කුල සඤ්ඤ සහ චතුධාතු වවත්ථානය යන කර්මස්ථාන හතලිහ"[24]

මෙයින් කියැවෙන සම සතලිස කුමක්ද?

| | | |
|---|---|---|
| i. | දස කසිණ | = 10 |
| ii. | දස අශුභ | = 10 |
| iii. | දසඅනුස්මෘති | = 10 |
| iv. | සතර බ්‍රහ්මවිහාර | = 04 |
| v. | සතර ආරූප්‍ය | = 04 |
| vi. | ඒක සඤ්ඤාව | = 01 |
| vii. | ඒක වවත්ථානය | = 01 |

කසිණ යනු කුමක් ද යන්න සුමංගල ශබ්ද කෝෂයට අනුව මෙසේ විස්තර වෙයි. "කසිණ - 1. සියල්ල, 2. පඨවි කසිණ, ආපො කසිණ, තේජෝ කසිණ, වායෝ කසිණ, නීල කසිණ, පීත කසිණ, ලෝහිත කසිණ, ඕදාත කසිණ, ආලෝක කසිණ, පරිච්ඡින්නාකාශ කසිණ, යන භාවනාවට අරමුණු කර ගන්නා කරුණු දහය..."[25]

භාවනාව යන්න පිළිබඳව විවිධ අර්ථ විවරණ තිබිය හැකිය. ධර්ම ග්‍රන්ථ සහ සිංහල සම්භාව්‍ය සාහිත්‍යයට අයත් කෘති රැසක් උපයෝගී කර ගනිමින් පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත නා හිමියෝ 'භාවනාව' යන්නට මෙසේ අරුත් දක්වති.

| | | |
|---|---|---|
| භාවනා | = | නානා ලම්බනයන්ට නොදී එකම සුදුසු අරමුණක සිත පැවැත්වීම ; කල්පනාකිරීම. වැඩීම. ඖෂධ සකස් කරන පිළිවෙළක්. |
| භාවනානුයෝග | = | නැවත නැවත භාවනා කිරීම |
| භාවනානුරූප | = | භාවනාවට සුදුසු |
| භාවනාභියෝග | = | භාවනාවෙහි යෙදීම |
| භාවනාභිසමය | = | භාවනා වශයෙන් එන අවබෝධය |
| භාවනාරාවතා | = | භාවනාවෙහි ඇලීම |
| භාවනාඅරියවංස | = | භාවනාරාවතාව නැමැති ආර්යවංශ ධර්මය |



| | | |
|---|---|---|
| භාවනාරාවත්ව | = | භාවනාවෙහි ඇලීම |
| භාවනාක්‍රම | = | භාවනාව පිළිබඳ පිළිවෙල සමාධි භාවනා ප්‍රඥාභාවනා ක්‍රම |
| භාවනා ප්‍රකර්ෂ | = | භාවනාවගේ අතිශය දියුණුව |
| භාවනාපර්යන්තජන්මක | = | භාවනා ප්‍රකර්ෂකයාගේ කෙළවර උපන් |
| භාවනාභූමි | = | සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන මාර්ග තුන |
| භාවනාප්‍රඥා | = | සකෘදාගාමි ආදි මාර්ග චින්තනයන් හි යෙදුන ප්‍රඥාව |
| භාවනාමය | = | භාවනාවෙහි නිපන්[26] යනුයි. |

විශුද්ධිමාර්ගයට අනුව භාවනාව සම්බන්ධයෙන් මෙසේ ද විස්තර වෙයි. "ද්වේ භාවනා අභිමතා" යනු ලෞකික භාවනාවයැ. ලෝකෝත්තර භාවනා යැයි භාවනා දෙකක් ම අභිප්‍රේතයි. ඔවුනතුරින් ලෞකික සීල - සමාධි - පඥාවන්ගේ ඉපදවීම ද, ඒ සීලසමාධි ප්‍රඥාවන්ගෙන් තමා සතන්හි පුරුදුවීම් විසින් පැවති සන්තාන වාසනාව ද ලෞකික භාවනාවයි.[27]

සමථ - විපස්සනා ධූර දෙක්හි නො යෙදී වාසය කරන්නා වූ කිසිදු පැවිදි - ගිහි තැනැත්තෙකුට සංසාර විශුද්ධිය ලබා ගත නොහැකි බව බුදු දහමේ උපදේශනයයි. සමථ - විපස්සනා මාර්ග යෙන් පමණක් පුද්ගලයා හා ලෝකය යථා තත්ත්වයෙන් වටහා ගත හැකි වෙයි. එම තත්ත්වය ලෝකෝත්තර ඥානය ලැබීමකි.[28] විපස්සනා යනු පාලි වචනයයි. එහි සිංහල වචනය විදසුන් යන්නයි. විදර්ශනා යනු සංස්කෘත වචනයකි.[29] සමථ හා විදර්ශනාභාවනාවේ වෙනස පැහැදිලි කරමින් පූජ්‍ය මඩවල උපාලි හිමියෝ මෙසේ ද දක්වති. "සමථ භාවනාවේ දී කරනුයේ ස්වාභාවික දෙයක් හෝ යහපත් සිතුවිල්ලක් මත නැවත නැවත සිත පිහිටුවාලීමයි. විදර්ශනාභාවනාව මීට හාත්පසින් ම වෙනස්ය. මෙය පැහැදිලි කර නොගත් අය භාවනාව යන වචනය ඇසෙන විටම කල්පනා කරනුයේ සිත එක අරමුණකට ගැනීම යන්නයි. මීට හේතුව

බොහෝ දෙනාට අහන්ට ලැබෙන්නේත් දකින්ට ලැබෙන්නේත් වැඩිවශයෙන්ම සමථ භාවනා උපදෙසුයි.[30]

සමථ විදර්ශනා භාවනා ක්‍රම දෙකින් විදර්ශනා භාවනා ධූර යන්න පැහැදිලි කරන පූජ්‍ය වැලිවිටියේ සෝරත හිමිපාණෝ මෙසේ දක්වති. විදර්ශනා = සාමාන්‍යයෙන් වෙනස් වූ දර්ශනය ; ලෝකය අනිත්‍යය ; දුඃඛය ; අනාත්මය යන ලෙසින් සැලකීම.

විදර්ශනා ධූර = භික්ෂූන් විසින් ඉසිලිය යුතු ධූර දෙකින් එකක් වූ විදර්ශනා භාවනාව.[31] විදර්ශනා යන්න පිළිබඳවත් විදර්ශනා ධූර පිළිබඳවත් සිංහල සම්භාව්‍යය සාහිත්‍යයේ කෘති ගණනාවක ම විස්තර සඳහන් වෙයි. සමථ හා විපස්සනා සුත්ත ලෙසින් සූත්‍ර දෙකක් සංයුක්ත නිකායෙහි අන්තර්ගත වෙයි. මෙයින් විපස්සනාසූත්‍රයේ අදහස මෙසේය.

"මහණෙනි, තොපට නිවනත් නිවන්මගත් දෙසන්නෙමි. එය අසවු. මහණෙනි, නිවන කවරේ ද යත් : මහණෙනි, යම් රාගක්ෂයෙක් ද්වේෂක්ෂයයෙක් මෝහක්ෂයයෙක් වේ නම් මහණෙනි, මේ නිවන යැයි කියනු ලැබේ. මහණෙනි, නිවන්මග කවරේ ද යත් : විපස්සනා යි. මහණෙනි, මේ නිවන්මඟැයි කියනු ලැබේ. මහණෙනි, මෙසේ මවිසින් තොපට නිවන දෙසන ලදි.[32] මේ අනුව විදර්ශනා යනුවෙනුත් විදසුන් යනුවෙනුත් වෙනත් භාෂාවන්ගෙන් කියැවෙන 'විපස්සනා' යන්න පෙළෙහි සඳහන් බුදු වදනකි. මේ බුද්ධ දේශනාව කෙතරම් ඉහළින් පිළිපදින ලදද යන වග පසුකාලීනව විදර්ශනා ධූර තනතුර ද එම තනතුරේ අනුනායක තනතුරක් ද පැවති බව ශාසන ඉතිහාසයෙන් හෙළිවෙයි. අස්ගිරි මහා විහාරයේ මෙම තනතුරෙහි ද ප්‍රධානත්වය ගෙන ඇත්තේ මහානායක හිමි බව අස්ගිරි උපත හෙවත් අස්ගිරි උප්පත්ති කථාප්‍රකරණට අනුව ප්‍රකට වෙයි.[33]

අස්ගිරි මහා විහාරයේ භාවනා සම්ප්‍රදය වශයෙන් සැලකිය හැකිවන්නේ ඉහත කරුණු අනුව විදර්ශනා ධූරයේ භාවනාවයි. මෙම ධූරයෙහි ස්වාභාවය දැන ගැනීම සඳහා ප්‍රධාන මූලාෂ්‍රය වන්නේ අස්ගිරි උපත හෙවත් අස්ගිරි උප්පත්ති කථා ප්‍රකරණය



සහ විමුක්තිමග්ගය යි. එසමයෙහි අස්ගිරි විහාරවාසී විදර්ශනා ධූර භික්ෂූන්වහන්සේ සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබෙන අයුරු සඳහන් වන්නේ මෙසේ ය. "........ ශ්‍රී වර්ධනාපුරයෙහි ප්‍රදේශ රජව කිසිවක් හට හිංසා පීඩා නොකර අල්ලස් පඬුරු නොගෙන අස්ගිරි විහාරයෙහි විදර්ශනා ධූරින සංඝයාට සිවුපසය දෙමින් දසකුසල ධර්මය පූරණය කරමින් රාජ්‍ය කරන ප්‍රස්ථාවේ දී........." [34] මෙයට තරමක් පසුකාලීනව රජ පැමිණි කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමයෙහි ද රජ්‍යනුග්‍රහය ලැබ අස්ගිරි විහාරයේ විදර්ශනා ධූරය පෝෂණය වූ බව එහිම දැක්වෙයි.[35] මෙහි විශේෂ සිදුවීමක් තිබෙයි. එම රජු විසින් ආරාධනා කරන ලදුව විදර්ශනාධූරාචාර්යවරු දෙදෙනෙකු වූ මහානාම හා බ්‍රහ්මස්වර හිමිවරු දෙදෙනා වහන්සේට නාගවිමානය නැමැති ස්ථානය කරවා පූජාකර තිබෙයි. මෙම දෙදෙනා වහන්සේ උපාලි හිමි සමඟ සියමෙන් වැඩි දෙනමක් වන්නාහ. උන්වහන්සේ දෙනම යටතේ උභය විහාරයෙන්ම භික්ෂූන් වහන්සේ විසිහතර නමක් සමසතලිස් කර්මස්ථානවල හික්මවන්නට භාර කළ බව ද සඳහන් වෙයි. මෙහි සඳහන් වූ මහානාම හිමි පසුව උඩවාසල ආරණ්‍යයෙහි වැඩසිටිමින් අස්ගිරි පේරුවේ දොළොස් නමකට රාම විහාරයේ දී විදර්ශනා ඉගැන්වූ බව අස්ගිරි උපත සඳහන් කරයි.[36] සියම දේශයෙන් වැඩිය භික්ෂූන් වහන්සේලාගෙන් විදර්ශනා ධූරය ප්‍රගුණ කළ තවත් හිමි නමක් වන්නේ උරුලෑවත්තේ ධම්මසිද්ධි සාමින් වහන්සේය.[37] පසු කලෙක මෙම විහාරයෙන් විදර්ශනා ධූරයෙහි අනුනායක තනතුර හෙබ වු රඹුක්වැල්ලේ රතනජෝති හිමි ගුරුවරයෙකු වශයෙන් අස්ගිරි විහාරයේ සාමණේරාදීන් සමසතලිස් කර්මස්ථානවල හික්මවමින් ප්‍රතිපත්ති ශාසනය වර්ධනය කළහ.[38] අස්ගිරි විහාරයේ විදර්ශනා භාවනාව සම්බන්ධයෙන් 'සමසතලිස් කර්මස්ථාන' කමටහන් වූ බව පැරණි ලේඛනවල සඳහන් වෙයි. එසේ නම් අස්ගිරි විහාරයේ භාවනා සම්ප්‍රදාය වශයෙන් සමසතලිස් කර්මස්ථාන මූලික කරගත් විදර්ශනා ක්‍රමයක් භාවිත වූ බව පැනෙයි. මෙම භාවනා ක්‍රමය ඉගැන් වූ සහ ඉගෙන ගත් ගුරුවරු සහ ශිෂ්‍ය යන දෙපිරිසක් අස්ගිරි විහාරයේත් එයට අනුබද්ධිත සාමන්ත විහාරවලත් වැඩ සිටි බව විවිධ මූලාශ්‍ර කෙරෙන් පැහැදිලි වන්නේ

ය. මේ සඳහා භාවිත අත්පොත හැටියට විමුක්තිමග්ගය ප්‍රධාන වෙයි. පසු කලෙක එය ආශ්‍රයෙන් නිර්මිත "විමුක්තිමග්ගය උද්දානං" යන පාලි ගාථා පන්තියෙන් ද තවද පසුව සැකසී ඇති අස්ගිරි මහාවිහාරයේ විදර්ශනා පොත ද යන ලේඛනත්‍රයම ග්‍රන්ථ ධූරය සඳහා පරිහරණය කරමින් විදර්ශනා ධූරයෙහි පිහිටි බව දැනගත හැකි වෙයි. විදර්ශනා වැඩීම සඳහා සමසතලිස් කර්මස්ථාන කමටහන් ලෙස යොදාගත් බව ඉහත ද දැක්වීමු. එකී කාරණාවෝ කෙසේද යත්. මෙය විශුද්ධිමග්ගයෙහි මෙසේ සඳහන් වෙයි.[39]

විමුක්තිමග්ගයෙහි සත්වැනි පරිච්ඡේදයට අයත් පෙළෙහි සිංහල පරිවර්තනයට අනුව උක්ත සමසතලිස් කර්මස්ථාන අතරින් කර්මස්ථාන තිස් අටක් මෙසේයි. දස කසිණ ; පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන භූත කසිණ සතර හා නීල, පීත, ලෝහිත, ඕදත, ආකාසායතන, විඤ්ඤාණායතන යන වර්ණ කසිණ හයත්ය.

## දස අසුභ

මැරී ඉදිමී ගිය මිනිය - උද්ධුමානකය, විනීලක - නිළවගිව මළකුණ, විපුබ්බක - කුණු සැරව ගලන මිනිය, විච්ජිද්දක - අවිමුව ආදියෙන් සිදුරුව ගිය මිනිය, වික්ඛායිතක - බලු හිවල් ආදීන් විසින් කා ඉතුරු කරන ලද මිනිය, වික්ඛින්නක - ඉවත දැමූ මිනිය, හත වික්ඛින්නක - විශේෂයෙන් ඉවත දැමූ මිනිය, ලෝහිතක - කැපුණු කැඩුණු තැන්වලින් ලේ ගලන මිනිය, පුලවක - හටගත් පණු කැදලි සහිත මිනිය, අට්ඨික - ඇට සැකිල්ල යන මේ අසුභ දහයයි.

## අනුස්සති දහය

බුදුන් සිහිකිරීමය, නව ලොව්තුරා දහම් සිහිකිරීම, අට අරිය සඟුන් සිහිකිරීම, සීල ගුණ සිහිකිරීම, ත්‍යාගී ගුණ සිහිකිරීම, දෙවියන්ගේ පින් ඵල සිහිකිරීම, මරණය සිහිකිරීම, කයෙහි තතු සිහිකිරීම, ආශ්වාස ප්‍රාශ්වාස සිහිකිරීම, උපසමය (නිවන) සිහිකිරීම යන දශයයි. සතර බ්‍රහ්මවිහාර නම් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන අප්‍රමාණ්‍ය සතර ය. අරූප සමාපත්ති සතරයි. මෙම තිස් අටට ආහාරපටික්කූල සංඥාව සහ චතු ධාතු වවත්ථාන දෙක ද ඇතුළුව සතලිහක් වන්නේය.[40]



අස්ගිරි මහාවිහාරයීය භික්ෂූන්වහන්සේ පුරාතනයේ සිටම ආරණ්‍යවාසී සම්ප්‍රදාය අනුව යමින් භාවනානුයෝගීව වැඩ වාසය කළ බව විමුක්තිමග්ගය අනුව පැහැදිලිය. සැබැවින්ම සමථ - විපස්සනා යන භාවනා ක්‍රම දෙකටම සමසතලිස් කර්මස්ථාන කමටහන් වූ වග ධර්ම කරුණු අනුව හඳුනා ගැනීමට පුලුවන්ය. මෙහි දී අස්ගිරි මහාවිහාරයේ විදර්ශනා ධූරීනතත්ත්වය අනුව විදර්ශනා භාවනාවම ප්‍රගුණ කළ සෙයක් දක්නට ඇත. දැනට මුද්‍රිත විමුක්තිමග්ග පොතෙහි අන්තර්ගත කොටස් වන විමුක්තිමග්ග, විමුක්තිමග්ග උද්දානං, අස්ගිරි ආරණ්‍යවංශික විදර්ශනා පොත යන තුන් කොටසම භාවනාව සඳහා උපදෙස් ලබා දෙන අත්පොත් සේ භාවිතව ඇති බව පැහැදිලිය. විශේෂයෙන් ම මෙම පොත තුළින් නවක භාවනායෝගීන් පුහුණු කරන අයුරු හොඳින් දක්වයි.

භාවනාවට සූදානම් වන අය පිළිපැදිය යුතු වත් සිරිත් ආදිය මෙහි හොඳින් දැක්වෙයි. ප්‍රායෝගික වශයෙන් එක්තරා ක්‍රමවේදයක් අනුවම මෙම භික්ෂූන්වහන්සේලා භාවනාවේ නිරත වූහ. විශේෂයෙන් ම ආචාර්යවරයෙකුගේ උපදෙස් අනුව භාවනාවේ යෙදුණු අයුරු මෙයින් පැහැදිලි වෙයි. 'විමුක්තිමග්ග උද්දානං' කොටසෙහි අංක 14 වන පාලි ගාථාවෙන් අදාළ විධික්‍රම භාවිත කිරීමට උපදෙස් සපයා තිබෙයි. ඒ මෙසේ ය.

"සංසාර භය පස්සන්තා
නිබ්බාණ සුඛ මිච්ඡතා
භාවනා විධි මිච්ඡන්තා
කාතබ්බාව ඉමං විධි " යනුයි.

යෝගාවචර තෙමේ භාවනා වැඩීමට ප්‍රථම පූර්ව කෘත්‍යන් කීපයක් සිදුකළ යුතු බවට මෙහි උපදෙස් සපයා ඇත. එහි ගාථා අංක 15-19 ඒ වෙනුවෙන් වෙන්ව තිබෙයි.

පූර්වකෘත්‍ය හෙවත් ප්‍රමුඛ කරුණ අවසන් කළ සද්ධාශීලගුණාදියෙන් යුක්ත යම්කිසි යෝගී කෙනෙක් සකසා සිවුරු හැඳ පෙරව ආචාර්යවරයාට සිටගෙනම වැඳනමස්කාර කිරීම පිළිබඳ ගාථා දෙකකින් මෙසේ විස්තර වෙයි.

ඇඟලොමුදැහැගන්නමින් බොහෝ සන්තෝෂයට පැමිණ ශ්‍රද්ධා වඩා දෙව්මිනිසුන් සහිත සියල්ලන්ටම පින් දී......"[44]

මෙම ක්‍රමය ක්‍රමක්‍රමයෙන් වර්ධනය කරමින් භාවනාවේ යෙදීමට උපදෙස් සපයා තිබෙයි. මෙහි සිත්‍ථක දීප පූජාව ආශ්‍රයෙන් කෙරෙන භාවනාව තවත් එක් උදහරණයක් වශයෙන් පෙන්වා දිය හැකිය.

"පුන දශගුල් ප්‍රමාණ ඉටිපන්දම් දෙකක් ඉදිකොට එයින් එක් ඉටිපන්දමක් ගෙණ අනුලෝම ඉටිපන්දමේ අන්තභාගයට අඟුලක් පමණ පරිකර්මය පිහිටුවා එයින් අඟුලකින් පාත උපචාරය පිහිටුවා උපචාර දෙක හොඳින් සිහි නුවණින් යෙදී අෂ්ඨිඨාන කොට හදවත තබා ගෙන නැවත එයින් අඟුලකින් පාත බුද්දක පීතියට සලාකයක් ඉඳුවා එයින් අඟුලකින් පාත ඛණිකා පීතියට සලාකයක් ඉඳුවා ඔක්කන්තිකාපීතියට සලාකයක් ඉඳුවා එයින් අඟුලකින් පාත උබ්බගො පීතියට සලාකයක් ඉඳුවා එයින් අඟුලකින් පාත එරණපීතියට සලාකයක් ඉඳුවා එයින් අඟුලකින් පාත හදයටසලාකයක් ඉඳුවා එයින් අඟලකින් පාත සමාධියට සලාකයක් ඉඳුවා මේ කී ලෙස නොවරදවා අනුලෝම යට කී ලෙසින් සලකා පිහිටුවා ගෙණ නැවත පාත්‍රයක් ගෙණ පාමුවවිට දඬුකඩක් තබා පළමුවඅනුලෝමඉටිපන්දම එහි ඉඳුවා වෙනින් පාත්‍ර දෙකකට පැන් පුරවා උභය භාගයෙහි සඳ තබා පස්මල් ඉස ඉටිපන්දම් පහක් අවුලුවා නැවත පෙර සෙයින් ආරාධනා කොට සුවඳ දුම්දී පුනදෙරියන් වියත් අත්පස තබා පලක් බැඳ වැඩහිඳ පස්වණක් ප්‍රීතියෙන් ඇඟලොමු දහ ගන්වමින් බොහෝ සන්තෝෂයට පැමිණ ශ්‍රද්ධාව වඩා දෙව් මිනිසුන් සහිතව සියල් ලෝ වැසියන්ට පින් දී නැවත අනුලෝමඉටිපන්දම අවුලුවා පරිකං උපචාර දෙක හොඳින් සිහිනුවණින් යෙදී අධිෂ්ඨාණ කොට සලකාබලා නැවත සලාකයෙන් සලාකයටආරාධනා කොට ද යන කෙණෙහි අනුලෝම බවමින් අරහං, අරහං, අරහන්, යන සති ආරම්මිනයෙන් යුක්තව හිඳ මේ පන්දම ද ගිය කෙණෙහි නැවත පටිලෝම පන්දම හිඳුවා පළමු කී ක්‍රමය නොවරදවා ආරාධනා කොට පිළිලොම් ඉටිපන්දමත් නිමවූ කල්හි පසඟ පිහිටුවා වැඳ මෛත්‍රි වඩා කරණීය මෙත්ත



සූත්‍රයෙන් පිරිත් බැණ පින් දී සති අරමුණෙන් නැගී සිට එයින් එක් පැන් පාත්‍රයකින් ආචාරීන් වහන් සේ නහවා වැඳ අවසර ලබා ගෙණ තිබුනු පැන් පාත්‍රය ගෙණ තමන් ඉසින් කතින් නහමින් භාවනා කරණු.සිත්‍ථක දණ්ඩ දීපං අනුලොම පටිලොමං නිඨිතං"[45]

මෙම භාවනා ක්‍රමයෙහි කමටහන් වඩන තවත් ක්‍රමයක් මෙසේ ය.

"නමොතස්ස --- බුඬස්ස---3 ඔකාස--- අච්චයො--- පෙ--- ආයතිං සංවරෙය්‍යාම 3 ඔකාස අහං පටි පෙ-- කරොමි අහං ආණා පාණ සති කම්මඨාණංභාවෙස්සාමි උග්ගහනිමිත්තංච පටිභාග නිමිත්තං උපචාර සමාධි මහත්‍ථාය ලභිතබ්බං නව ලොකුතතරධමමා-- පෙ-- නිබබාණ පච්චයෝ හෝතු"මෙසේ ආරාධනා කොට පසඟ පිහිටුවා වැඳ පෙර කී සෙයින් මලසුන අභිමුඛයේ පළක් බැඳ ආසනයේ හිඳ යටකී ක්‍රමයෙන් ආශ්වාස ප්‍රශවාස වශයෙන් සති ආරම්මණ කර්මස්ථාන උපදවා හදවත තබා නැවත පිරියම් පඨමං දුතියං තතියං චතුත්‍ථං පඤමං යන්නෙන් ගමනාගමනයට බවා මෙසේ තීක්ෂණ ඥාණයෙන් මනස්කාරය ආශ්වාස ප්‍රශ්වස හා සමග මෙනෙහි කරන්නාහට උග්ගහ ප්‍රතිභාග නිමිත්තවය උපදී. එහි ලක්ෂණ කෙබඳුදයත් උග්ගහ නිමිත්තේ කිසුණු දොස් රැළ නැග නැඟී පෙණ බුබුලු මුසු දියෙක් වී නම් එබඳුවම වැටහේ. පෙණ පහර ආදී කිසිණු දොස් පෙණේ. නොහොත් සලා වැටුප් දෙමින් ඇඹරෙමින් සැලෙමින් නැගෙණ දුම් සලාවක් මෙන් අහස් හී සුදු වලාකුළක් මෙන්ද උගගහ නිමිතත පෙණේ. ප්‍රතිභාග නිමිතතය අහස තාබූ මිණිතල්වැටක් මෙන්ද මිණිමය කැටපතක් මෙන්ද වලාතුරෙන් නික්මුණු සඳමඬලක් මෙන්ද මෙඝ මුඛයෙහි බලාකාවකු මෙන්ද උග්ගහ නිමිත්ත පලා ගෙණ නික්මුණාක්හු මෙන් උග්ගහ නිමිත්තට වඩා කිසුණු දෙස් නැතිව සීයක් ගුණ දහසක් ගුණයෙන් පිරිසිදුව භාවාංගය සිඳගෙණ මනොද්වාරය ආවර්ජනා කොට ආකාශ ධාතුව පහළවේ. පුන යටකී සියලු ආරාධනාවෙන් ආණාපාණ සති කමටහන් බවමීන් හුන් කෙණෙහි ආකාස ධාතුව අප්පණාව පෙණේ. නැවත පරිකං උපචාර පෙණේ. නැවත ආකාස ධාතුව නාසිකාග්‍රයේ තබා බලා නැවත පරිකං උපචාර හොඳින්

බලා හෘදයේ බැඳ නාභියේ තබනු. නැවත ඇදුරු උපාධ්‍යයන් වහන්සේලාගෙන් අවසර ලබා ගෙන මල් අස්නක මල් පස්ගොඩක් කොට නැවත විලඳපස්ගොඩක් කොට ඉටිපන්දම් දහයක් ගෙන පහක් සද පහක් ආචාරීන් වහන්සේට දෙනු සඳහා තබා නැවත පස්මල් ඉස සුවඳ දුම් දී පුන වඳැම් හනෙත ගුරුන් හා බුදුන් වැඳ, නැවත පළමු සෙයින් එක් ධාතුවක් පාසා තුන් තුන් ආකාරයෙන් ලක්ෂණයන් දකිමින් ඇඟ ලොමුදහගන්වමින්සන්තෝෂයටපැමිණ ශ්‍රද්ධාව වඩා විපස්සනා භාවනාවට අනුකූලව බණ අසා පස්වණක් ප්‍රීතියෙන් ඇඟ ලොමු දහගන්වමින් අධිකතර සතෙතාෂයට පැමිණ ශ්‍රද්ධාව වඩා දෙව් මිනිසුන් සහිත සියලු ලෝ වැසියන්ට පින් දී නැවත පෙර ලෙසින් ආරාධනා කොට දශ දිශාව බලන ක්‍රම නම් (මෙසේ භාවනාවේ යෙදෙන යොගොවචර භික්ෂුව විසින් ප්‍රඥ නැමැති හිරු රැසින් කාමච්ඡන්‍දා දී මෝහ නැමැති සණාන්ධකාරය විධ්වංශනය කෙරෙමින් ආශ්වාස ප්‍රශ්වාසය හා සමග මෙනෙහි කර භාවනා කළ කල්හි මනොච්චාරය ආවජීනා කොට ආකාස ධාතුව පහළ වේ. එහි අප්පණා උපචාර මනාකොට බලා දශ දිගට බලන විධි අතුරෙන් චිත්තවිඥ්ඥානයෙන් පැදුම් දිග බලන ක්‍රම නම් නාසිකාග්‍රයේ පටන් මෙම අප්පණා පරිකං උපචාර ක්‍රමයෙන් අඟුල් ගණනින් බල බලා ඞාදශඅඟුලක් ඈත බැලූ කල්හි වියතෙක් වේ. එකල්හි හුයක අමුණන ලද නානාවර්ණ මුතුවැලක්සේද මල්දමක් මෙන්ද වැටහේ.[46]

බඹරගලේ කමටහන් පොතට අයත් කොටසෙහි දැක්වෙන පහත සඳහන් විස්තරයෙන් ධ්‍යාන වැඩීමේ ස්වරූපය මෙසේ ද පෙන්නුම් කෙරෙයි.

වියත් 2 රියන් 1 යොදුන් 100 දහසක් බැලූ කල්හී සාගරය වැනි

රියන් 2 වඩු රියන් 1 සටහන් වේ. ඉන් ඈත බැලූ කල්හී අශව කණ්දී

වඩු රියන් 1 යටෙක 1 සත් කුළ පව්ද ඉන් ඈත මේරු මස්තකයන



යට 20 ඉසුඹු 1 සංඥාගෙන එහි ඡම් අපපණා උපචාර පරිකම්

ඉසුඹු 80 ගව් 1 අනුලෝමයෙන් තබනු.

ගව් 4 යොදුන් 1

පූර්ව දිශාය - දක්ෂිණ දිශාය පශ්චිම දිශාය උතතර දිශාය, අගනි දිශාය, නිරිත දිශාය - වයඹ දිශාය, හෙඨිම දිශාය, උපරිම දිශාය, ධාන්‍ය මාස සතෙක් නම් අඟුලෙක දොළොස් අඟුලෙක් වියතෙක දෙවියතෙක් රියනෙක සත්රියනෙක් නම් යටෙක විසි යටෙක් ඉස්බෙක අසූ ඉස්බෙක් ගව්වෙක සතර ගව්වෙක් යොදුනෙක දශ දශයෙක් නම් සියයෙක සිය දසයෙක් දහසෙක දහස් සියයෙක් ලක්ෂයෙක ලක්ෂ සියයෙක් කෙළක කෙළ සියයෙක් කෝටියෙක කෝටි සියයෙක් ප්‍රකෝටියෙක ප්‍රකෝටි සියයෙක් නහුතයෙක. නහුත සියයෙක් නින්නහුතයෙක නින්නහුතසියයෙක් හුතනහුතයෙක හුතනහුත සියයෙක් කඹයෙක කඹ සියයෙක් විස්කඹයෙක විස්කඹ සියයෙක් අක්ෂෞහිණියෙක අක්ෂෞහිණි සියයෙක් බිඳුයෙක බිඳු සියයෙක් අබ්බුදයක අබ්බුද සියයෙක් නිරබ්බුදයෙක නිරබ්බුද සියයෙක් අබබබයක අබබ සියයෙක් අටටයෙක අටට සියයෙක් අහහයෙක අහහ සියයෙක් කුමුදයෙක කුමුද සියයෙක් සෞගඳියෙක සෞගඳි සියයෙක් උත්පලයෙක උත්පල සියයෙක් පුණ්ඩරීකය පුණ්ඩරීක සියයෙක් පදුමයෙක පදුම සියයෙක් කථානයෙක කථාන සියයෙක් මහාකථානයෙක මහා කථාන සියයෙක් අසංඛ්‍යයෙක සක්වල මුවවිටින් ඇතුළත සතිස් ලක්ෂ දශදහස් තුන්සිය පණස් යොදුන් පිටතින් වට තෙ සාලිස් ලක්ෂසූසැට දසිය පත්තිස් යොදුන් දෙගව් දෙපණස් ඉසුඹු යටයෙක දෙරියන් පමණය. සක්වල පූර්ව දිශාවෙහි පිටත කෙළවර පටන් පශ්චිම දිශාවෙහි පිටත කෙළවර දක්වා මේ අතුරෙ විස්තාරය තෙළෙස් ලක්ෂ අටාසූදස් සත්සිය සුසාළිස් යොදුන් එක් ගව් පන්සැට ඉසුඹු දශයට තුන්රියන් පසඟුල් පමණය. ඉන් මහමෙර විතර වට තිස්දහස් යොදුන් හැර හාත්පසින් මහමෙර පටන් සක්වල මුව විට බාහිර කෙළවරට එකී එකී පිටින් සලක් නව සැත්තෑ දහස් තුන්සිය තෙසැත්තෑ යොදුන් දෙසැත්තෑ

ඉසුඹු සොළොස්යට එක් රියන් එක්වියත් දැඟුල් පමණය. මේ හැම චාතුම්මහාරාජික දිව්‍ය ලෝකයටම අවකාස විය. එහි තාරකාවන්ගේ ගණන එක් ලක්‍ෂ අටසැට දහස් හාරසිය සිව්සැටකෙළතිස් ලක්‍ෂ දශනවදස් සිය, සිය සතාසුවක් පමණය. මහමෙර මුදුන පටන් පාත කෙළවරට එක් ලක්‍ෂ අටසැටදහසක් යොදුන, දෙමුනත පුලුල දසදහදක් යොදුන ඉන් එක් මුදුනතෙහි අවට එක් තිස්දස්සාරසිය විසි අට යොදුන් දෙගව් දෙවිසි ඉසුඹු දසසක් යට එක් රියන් පමණයි. උඩට දෙසාළිස්දහසක් යොදුන් හැර යුගන්ධර පර්වත මුදුනට සමවූ තැන විතර තිස්දහසක් යොදුන් හෙයින් එතැන්හි සිව්සැට අනුදස් දෙසිය පසාසු යොදුන් දෙගව් අටසැට ඉසුඹු එකොළොස් යට තුන්රියනක් පමණ හෙයිවුක් සමවැද විතර පනස්දහසක් යොදුන් පමණට වට එක් ලක්‍ෂ සත්පණස්දස් එක්සිය දෙසාළිස් යොදුන් තුන්ගව් සිව්තිස් ඉසුඹු පස්යට, පස් රියනක් පමණක් ම හෙයිනුත්, එයින් යට භාගයෙහිද මත්තෙහි කී අයම විතරටම සමයි. ජම්බුදීපයෙහි මනුසසාවාසය තුන් දහස් යොදුන් හිමාලය තුන් දහසක් යොදුන් සමුද්‍රය සාර දහසක් යොදුන් මහමෙර සසර තුන් දහසක් තුන්සියතිස් යොදුන් එක්ගව් සව්සි ඉසුඹු දශතුන් යටදෙරියන් අට අඟුලෙක් වෙයි. සහසස චකක වාළතො සත සහසසචකකවාලතෝ අනනතචකකවාල බලා මෙකී ලෙස නොවරදවා එක් දිශාවක් බැගින් දශදිශාව අනුලෝම පටිලෝම බලා නැවත ආකාස ධාතුව දකුණු නාසිකාව මැද තබා පෙරමෙන් තේවාව නිමවා ධ්‍යානයට ආරාධනා නම්

(මේ ක්‍රමයෙන් පූර්වදිග හෝ පශ්චිම දිග හෝ දකුණු දිග හෝ උතුරු දිග හෝ අනුදික් අතුරෙන් ගිණිකොණ, නිරිත, වයඹ, ඊසාන යන අට දිගම පෙර දිගට කියන ලද විධියෙන් අනුලෝම පටිලෝම කොට නැවත මත්තෙහි මේරු මන්‍දරාදී පර්වතයන් නොබලන හෙයින් චාතුම්හාරාජිකාදී සදිව්‍ය ලෝකයද සොළොස් බඹතලයද බලා අජටාකාශයට බැලිය යුත්තේ ය).[47]

අස්ගිරි මහාවිහාරයීය භාවනා කමටහන් අත්පොත්වලට අනුව පෙනී යන්නේ මනා වූ පුහුණුවක් සහිතව මෙහි භාවනා වැඩූ බවයි. විශේෂයෙන්ම සමසතලිස් කර්මස්ථාන අනුව භාවනාවෙහි



නිරත වන්නට ආධුනික යෝගාවචරයන් වහන්සේ පුරුදු පුහුණු කළ ප්‍රවීණ ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේ පිරිසක් වැඩසිටි බව ද පිළිගැනීමට සාධක තිබෙයි. විමුක්තිමග්ග, විමුක්තිමග්ග උද්දානං සහ බඹරගලේ කමටහන් පොත ද ඒ හා සම්බන්ධ සෙසු පිටපත් මගින් ද පැහැදිලි වන්නේ භාවනාව සම්බන්ධයෙන් ක්‍රමානුකූල ක්‍රමවේදයක් උක්ත මහාවිහාරයේ සහ තදනුබද්ධ සෙනසුන්වල ක්‍රියාත්මක වූ බව ය. දීර්ඝ වශයෙන් විස්තර කෙරෙන මෙකී භාවනා ක්‍රමවේදය අදාළ අත්පොත්වලින් තව ද දැනගැනීමට පුලුවන් ය.

## අන්ත සටහන්


1. විමුක්තිමග්ගො සංස්,.ගල්කැටියාගම සිරිරතනජෝති, කරල්ලියද්දේසිරිරතනජෝති ලංකාණ්ඩුවේ මුද්‍රණාලය 1963 කොළඹ
2. මන්දරම්පුරපුවත,.-සංස්. ලබුගම ලංකානන්දහිමි, මොල්ලිගොඩ කර්තෘ 1958.
3. අස්ගිරි තල්පතසංස් .- මැන්දිස් රෝහණධීර සංස්කෘතිකකටයුතු දෙපාර්තමෙන්තුව 1963 කොළඹ.
4. අස්ගිරි උපත හෙවත් අස්ගිරි උත්පත්තිකථා ප්‍රකරණය සංස්, තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමි, සංස්කෘතික කටයුතු දෙපාර්තමෙන්තුව, 2000, කොළඹ.
5. විමුක්තිමගෙගා, පෙරවදන, පි xi.
6. එම. පි. xiv
7. විස්තරාර්ථ සත්නසහිත විශුද්ධිමාර්ගය. ...සංස්. මාතර ශ්‍රී ධර්මවංශ හිමි .- බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2015 (සිව්වන මුද්‍රණය). ප්‍රස්ථාවනාවපි. xvi .
8. එම. පි. xix
9. සාරසංකෝෂ සංග්‍රහය, ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය, අස්ගිරිය මහා විහාරය සත්සියවන

   වර්ෂපූරණය. සංස්, ආනමඩුවේ ධම්මදස්සීහිමි සහ තවත 'හිමිවරු. අස්ගිරි මහාවිහාරය. 2012. පි. 40-43.
10. විමුක්තිමගෙගා,- පෙරවදන, පි xxi.
11. INSCRIPTIONS OF CEYLON.VOL.1 S. PARANAVITANA, DEPARTMENT OF ARCHAEOLOGY. CEYLON. 1972. P. 63

12. ධම්මානන්ද හිමි, නාවුල්ලේ.- මධ්‍යම ලංකා පුරාවෘත්ත, ගුණසේන.1969, කොළඹ. පි. 201-203.

13. සීලබන්ධ හිමි, තුඹුල්ලේ.... අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය, විකාශනය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදය. අධ්‍යාපන දෙපාර්තමේන්තුව. 1997. කොළඹ. පි. 54.

14. ධම්මානන්ද හිමි, නාවුල්ලේ..............පි. 202-203

15. සීලබන්ධහිමි, තුඹුල්ලේ............... පි. 54.

16. අස්ගිරිඋපත.- සංස්. තුඹුල්ලෙ සීලබන්ධ හිමි, සංස්කෘතිකකටයුතු දෙපාර්තමේන්තුව, 2000. කොළඹ පි.26.

17. එම.

18. අස්ගිරි තල්පත. පි. 8.

19. එම.

20 එම. පි. 9.

21. සීලබන්ධ හිමි, තුඹුල්ලේ........පි. 57.

22. අස්ගිරිඋපත......... පි. 16-17.

23. එම .......... පි. 26.

24. බෞද්ධශබ්දකෝෂය II සම්. සිරි ලියනගේ, ඉඳුරු ඕෆ්සෙට්, කොට්ටාව පි. 1534.

25. ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය, සම්. වැලිවිටියේ සෝරත හිමි, ගොඩගේ පළමුවන මුද්‍රණය, 2015, කොළඹ. පි. 51

26. එම 714.

27. සිංහල විශුද්ධිමාර්ගය, ශ්‍රී ධර්මවංශ හිමි, සිංහලානුවාදය. කාල්ටන් මුද්‍රණය බු. ව. 2512 මාතර. පි. 1105

28. නිවන් මඟ: 29වන කලාපය. සංස්. චන්ද්‍රතිලක බුලත්සිංහල. "ථෙරවාද භාවනා ක්‍රම හා ජපන් ෂෙන් ඉගැන්වීම් පිළිබඳ තුලනාත්මක විග්‍රහයක්" : බී. ඒ. විමලසේන. බු.ව. 2542. රජයේමුද්‍රණ දෙපාර්තමේන්තුව.කොළඹ. පි. 105-110

29. එම ................ බෞද්ධභාවනා, පූජ්‍යමඩවල උපාලිහිමි.පි. 93-99

30. එම. පි. 97

31. ශ්‍රී සුමංගලසිංහල ශබ්දකෝෂය.පි. 941.



32. සංයුක්තනිකාය 4. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල. 2005. පි. 640-641

33. අස්ගිරි උපත. සංස්. තුඹුල්ලේ සීලබන්ධ හිමි, සංස්කෘති කකටයුතු දෙපාර්තමේන්තුව, 2000. කෝළඹ පි. 28.

34. එම. පි. 15

35. එම. 23

36. එම. 23

37. එම. 25

38. එම. 26

39. සිංහල විශුද්ධිමාර්ගය, මාතර ධර්මවංශ හිමි අනුවාදය. කාල්ටන් මුද්‍රණය. බු. ව. 2512 මාතර. පි.170.

40. විමුක්තිමගෙගා........පි. 59.

41. එම. පි. 110.

42. එම.

43. එම.

44. එම. පි. 191.

45. එම.

46. එම.

47. එම.